# හින්දූන්ගේ රාජ්‍ය පාලන සංකල්ප අද්‍යතනයට දායක කර ගත හැකි ආකාරය පිළිබඳ විමසුමක්

***සුසීම, පූජ්‍ය ඕපනායක*** [1]

රාජ්‍ය පාලනය පිළිබඳ හින්දු සංකල්ප ඈත අතීතය හා බැඳී පවතී. බ්‍රාහ්මණ චින්තනය හා බ්‍රාහ්මණ සංස්කෘතිය අධිපති ස්වරූපයෙන් පැවති වෛදික සම්ප්‍රදාය තුළ හින්දූන්ගේ රාජ්‍ය පාලන සංකල්ප සඳහා හිමි වූයේ ඉහළ ස්ථානයකි. ඔවුන්ගේ රාජ්‍ය පාලනයේ පාලකයා ප්‍රධාන වුවද පාලකයා හික්මවීමේ සුවිශේෂ කාර්යය පැවරී තිබුණේ හින්දු ආගමික පූජකවරුන්ටය. තත්කාලීන පාලන විෂය වූ කලි සාරධර්මයන්ගෙන් ගහණ වූවකි. ආගමික න්‍යායන් මගින් පාලකයාත් රට වැසියාත් හික්මවා තිබුණි. රටෙහි ආර්ථික, දේශපාලනික, සාමාජික හා සංස්කෘතික යන විවිධ අංශ සංවර්ධනයට පත්ව තිබුණි. ඒ ආකාරයට රටක් සංවර්ධන වන්නේ පාලන සංකල්පයේ පවතින සුවිශේෂ ලක්ෂණ නිසාවෙනි. හින්දු දර්ශනය තුළ ඔවුන්ට අනන්‍ය පාලන සංකල්පයන් රාශියක් නිර්මාණය කොට තිබුණි. එම හින්දූන්ගේ රාජ්‍ය පාලන පිළිබඳ සංකල්ප අද්‍යතන රාජ්‍ය පාලනයට දායක කර ගත හැක්කේ කෙසේද යන්න විමර්ශනය කර බැලීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණයි. **'මනුස්මෘතිය'** හා **'ඓතරේය'** බ්‍රාහ්මණය වැනි හින්දු රාජ්‍ය පාලනය පිළිබඳ තොරතුරු සහිත ග්‍රන්ථ මූලාශ්‍රය කොට ගනිමින් මෙම පර්යේෂණය සිදු කොට තිබේ. දිගු කාලයක විකාශනයේ ප්‍රතිඵලයක් වශයෙන් වර්තමාන රාජ්‍යයේ ස්වරූපය සූක්ෂම වී ඇත. එහෙත් එහි මුල් ආකෘතිය රාජධර්මවල ගැබ්ව පවතියි. රාජධර්ම මත පාලනය වූ සමාජය යහපාලනය සහිත වූවකි. පාලනයේ ආරම්භය යහපත් වුවද වර්තමානය වන විට එය පිරිහීමට පත්ව ඇත. එම නිසා වර්තමාන දේශපාලනය තුළ දක්නට ලැබෙන අදූරදර්ශී පාලන ලක්ෂණයන්ට සහ අත්තනෝමතික ක්‍රියාකාරකම්වලට මනා පිළිතුරක් මුල් කාලීන හින්දු ඉගැන්වීම් මගින් ලබා ගත හැකිය.

**ප්‍රමුඛ පද:** රාජ්‍ය පාලනය, හින්දු සංකල්ප, මනුස්මෘතිය, වර්තමාන දේශපාලනය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*suseemathero90@gmail.com*